Weekly School Department of Education,Sabaragamuwa Province

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 10

විෂය:- නාට්‍ය හා රංග කලාව

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

**නිපුණතාව -** නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම -** ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ රංගන ශිල්පීන් පිළිබඳව විමසයි.

**රත්නා ලාලනී ජයකොඩි**



1969.ජනවාරි මස 8 වන දිනඋපත ලැබූ මෙතුමිය බන්දුල විතානගේ මහතාගේ "වැනිසියේ වෙළෙන්දා" නාට්‍යයෙන් වේදිකාවට පිවිසි ය.මෙතුමිය රංගනයට මෙන්ම නර්තනයටද ගායනයටද එකසේ දස්කම් දක්වයි.අවුරුදු දහයක් තුළ නාට්‍ය විසිපහකට රංගනයෙන් දායක වූ ඇය එයින් භූමිකා හතක් එක් කොට "අසූ එක - අනූ එක " නමෙන් නාට්‍ය උළෙලක් සංවිධානය කළ අතර දශක තුනක කාලයක් තුළ නාට්‍ය පනහක( 50) ක පමණ රඟපා තිබේ.මේ තුමිය රංගන දායකත්වය ලබා දුන් නාට්‍ය ලෙස,ඩග්ලස් සිරිවර්ධනගේ" සුභ සැන්දෑවක්" ලීසාගේ චරිතයත්, කපිල කුමාර කාලිංගගේ" නෙළුම් පොකුණ" නාට්‍යයේ සිල්වියාගේ චරිතයත් , මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ " ප්‍රේමතෝ ජායතී සෝකෝ " ස්වර්ණ තිලකාගේ චරිතයත් ,"මනමේ " නාට්‍යයේ මනමේ කුමරියගේ චරිතයත් , කේ බී හේරත් මහතාගේ "මායාදේවි" නාට්‍යයේ ලක්ෂ්මීගේ චරිතයත් ජයලත් මනෝරත්නයන්ගේ " තලමල පිපිලා" නාට්‍යයේ මහේෂිකාගේ චරිතයත්,අන්දරේලා නාට්‍ය යේ අන්දරේවතී සහ "ගුරු තරුව" නාට්‍යයේ සංගීත ගුරුවරියත් ශ්‍රියන්ත මෙන්ඩිස්ගේ "වර්ණ " නාට්‍යයේ රෝස් යන චරිතයත් යන

නාට්‍ය සඳහා තම රංගන දායකත්වය ලබා දී ඇත.එමෙන්ම උදිත ශ්‍රී ලාල් ගේ " තිරිවානා අතරින් " නාට්‍යයේ ශ්‍යාමලී ,කේ බී හේරත් මහතාගේ මායාදේවි නාට්‍යයේ ලක්ෂ්මී ජයලත් මනෝරත්නයන්ගේ පුත්‍ර සමාගම නාට්‍යයේ නීනාත් යන නාට්‍යවල රංගනය වෙනුවෙන් විශිෂ්ට කුසලතා සම්මානය ද සෝමපාල පතිරණ ගේ තුන්මංසල බන්දුල විතානගේ ගේ රෝමය ගිනි ගනී ,සුනන්ද සිල්වාගේ පාරාජිකා සහ දිවයින සාම නාට්‍ය උළෙලේ ද මීට අමතරව ටෙලි නාට්‍ය හා චිත්‍රපට රාශියක රංගනයෙන් දායක වී ඇති රත්නා ලාලනී රත්නාලාලනී මහත්මිය ගුවන් විදුලියේ ළමා වැඩසටහන වලට ද හා ගුරුකුලය, ලන්දේසි පුවත, රූකඩ පැංචා ,ගුවන් විදුලි රඟමඬල, ආදී වැඩසටහන් වලට ද දායකත්වය සපයා ඇත.

**නීල් අලස්**



1971 දී අහඹු ලෙස වේදිකා නාට්‍යයට සම්බන්ධ වන මොහු දයා වයමන් ගේ අම්මයි පුතයි වේදිකා නාට්‍යයෙන් ප්‍රසිද්ධ වේදිකාවට අවතීර්ණ විය.දයානන්ද ගුණවර්ධනගේ ගජමන් පුවත නාට්‍යයේ ජෝන් ඩොයිලිගේ චරිතයත් මහා චාර්ය සරච්චන්ද්‍රයන්ගේ වෙස්සන්තර නාට්‍යයේ සඳමහ රජු ගේ චරිතයත් ආර් ආර් සමරකෝන් ගේ කැලණි පාලම නාට්‍යයේ චූටි අයියගේ චරිතයත් රංජිත් ධර්මකීර්තිගේ මෝදර මෝල නාට්‍ය ලක්දාස ගේ චරිතයත් ධර්මසිරි බණ්ඩාරනායකගේ ධවල භීෂණ නාට්‍යයේ ෂෝන් සහ ට්‍රෝජන් කාන්තාවෝ නාට්‍ය යේ පොසයිඩස්ගේ චරිතයත් ජයලත් මනෝරත්නයන්ගේ මනෝරත්නයන් ගේ අන්දරේලා නාට්‍යයේ පිලිමතලව්වේ ගේ චරිතයත් ,කේ බී හේරත් ගේ තෙවැනි මහින්ද නාට්‍යයේ 6 වැනි අග්බෝ ආදී නාට්‍ය රාශියකට ඔහුගේ රංගන දායකත්වය ලබා දී ඇත.මීට අමතරව රංජිත් ධර්මකීර්තිගේ

හිරු නැති ලොව හා අංගාරා ගඟ ගලා බසී,ආඩි රළේ අම්බලම,ආර් ආර් සමරකෝන් ගේ ඉඩම ,අහසින් වැටුණු මිනිස්සු,ජේලර් ඔන්න ඔහේ ලූෂන් බුලත්සිංහලයන්ගේ තාරාවෝ ඉගිලෙති හේමසිරි ලියනගේ මහතාගේ නරියා සහ කේජු ආරියරත්න විතානගේ මහතාගේ සිකුරු යුද්දේ තෙල් දෝතක් ජයලත් මනෝරත්නයන් ගේ මහගිරිදඹ ප්‍රසන්න විතානගේ මහතාගේ ආවේ අජිත් අජිත් ජිනදාස යන්ගේ යාත්‍රා කේ බී හේරත් මහතාගේ ways වෙස් යන නාට්‍යවල ද නීල් අලස් චරිත නිරූපණය කොට තිබේ දක්ෂ රංගන ශිල්පියකු වූ ඔහු වේදිකා නාට්‍යවලට අමතරව ටෙලි නාට්‍ය හා චිත්‍රපට නළුවකු ලෙස ද ප්‍රේක්ෂක අවධානය දිනා ගත්තෙකි.

**මැණිකේ අත්තනායක**



ආර් ආර් සමරකෝන් ගේ කැලණි පාලම වේදිකා නාට්‍යයේ රූපවතී ගේ චරිතයට පණ පොවමින් ප්‍රේක්ෂක අවධානය දිනා ගත් මැණිකේ අත්තනායක මහත්මිය වේදිකා නාට්‍ය රාශියක චරිත නිරූපණය කළ දක්ෂ රංගන ශිල්පිනියකි .මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ ලෝමහන්ස,දයානන්ද ගුණවර්ධනයන්ගේ මධුර ජවනිකා ,පුන්‍යසෝම ගුණසිංහයන්ගේ දික්තල කාලගෝල,රංජිත් ධර්මකීර්තිගේ මෝදර මෝල,අජිත් මෙන්ඩිස් ගේ නිශ්ෂබ්ද වෙනු ආදී නාට්‍යවලට ඇය තම රංගන දායකත්වය දක්වා ඇත වේදිකා නාට්‍යය ට අමතරව විශේෂයෙන්ම ටෙලිනාට්‍ය නිළියක ලෙස ද චිත්‍රපට නිළියක ලෙස ද ඇය ප්‍රේක්ෂක ප්‍රසාදය දිනාගෙන සිටී.

**ප්‍රශ්න -**

1. අසූ එක - අනූ එක නමින් නාට්‍ය උළෙලක් සංවිධානය කළ රංගන ශිල්පිනිය වන්නේ කවුද?
2. නීල් අලස් මහතා රංගන දායකත්වය ලබා දුන් වේදිකා නාට්‍ය තුනක් සඳහන් කරන්න .
3. රත්නාලාලනී මහත්මිය දායකත්වය ලබාදුන් ලබා දුන් ගුවන් විදුලි වැඩසටහන් තුනක් නම් කරන්න .
4. කැලණි පාලම වේදිකා නාට්‍යයේ රූපවෙතීගේ චරිතයට පණ පොවමින් ප්‍රේක්ෂක ආදරය දිනා ගත් රංගන ශිල්පිනිය නම් කරන්න .

5. මැණිකේ අත්තනායක මහත්මිය විසින් රංගනයෙන් දායකත්වය ලබා දුන් වේදිකා නාට්‍ය හතරක් නම් කරන්න .